# ශ්‍රී ලංකා ගුරු සේවය

## උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරුසේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම.

1. බඳවා ගැනීමට අදාළ විස්තර අඩංගු කරමින් ප්‍රසිද්ධ පුවත්පත් නිවේදනය මගින් සුදුසුකම් ලත් අයදුම් කරුවන්ගේ අයදුම්පත් කැඳවීම.
2. පුවත්පත් නිවේදනයේ දක්වා ඇති පරිදි අයදුම්කරුවන් සඳහා තරඟ විභාගය පැවැත්වීම (ලිඛිත,ප්‍රායෝගික)
3. බඳවා ගැනීමට අදාළ පුවත්පත් නිවේදනයේ කොන්දේසි හා නියමයන්ට අනුව අයදුම්කරුවන් තරග විභාගයේදී ලබා ඇති ප්‍රතිඵල අනුව දන්වා ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනිම.
4. මෙම බඳවාගැනීමට අදාල මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.

**මූලික සුදුසුකම්**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

II. ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂී කරන ලද විෂය ක්ෂේත්‍ර වලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක දකුණු පළාතේ අඛණ්ඩ පදිංචිය හෝ පූර්වාසන්න වසර 03 ක කාලය තුල කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමග අයදුම්කරුගේ පූර්වාසන්න එක් වසරක පදිංචිය තිබිය යුතු ය.

IV. දකුණු පළාත තුළ පදිංචිය වෙනස් කර ඇත්නම් ස්ථිර පදිංචිය ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වශයෙන් පූර්වාසන්න එක් වසරකවත් අඛණ්ඩ පදිංචිය තිබිය යුතුය.
(පදිංචිය සනාථ කරගැනීම මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි නාමලේඛනය අනුව සිදුකරනු ලැබේ)

V. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

VI. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

මෙම බඳවා ගැනීම් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින්ම සිදුකරන අතර ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I(අ) ශ්‍රේණියට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

## ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී පත්වීම් ලිපි නිකුත් කිරීම.

1. රේඛීය අධ්‍යාපන ලේකම් විසින් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සම්පූර්ණ කරන ලද ඩිප්ලෝමාධාරීන් සම්මුඛ පරීක්ෂණයට ලක් කර දකුණු පළාතට බඳවා ගන්නා අයගේ නාම ලේඛනය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කිරිම කරනු ලබයි.

2. පුරප්පාඩු සහිත පාසල් සඳහා ඩිප්ලෝමාධාරින් ස්ථානගත කරමින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ඔවුන්ගේ පත්වීම් ලිපි නිකුත් කරනු ලැබේ.

**අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරුසේවයේ 2 වන පන්තියේ ii ශ්‍රේණියට බඳවා ගැනීම**

1. අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්ගේ නාම ලේඛනයේ සෑම වර්ෂයකම කොළඹ විශ්ව විද්‍යාලය මඟින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමුකරනු ලැබේ.

2. රේඛීය අධ්‍යාපන ලේකම්ගේ අනුමැතියට යටත්ව මෙම අධ්‍යාපනවේදී උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයට ලක්කර පුරප්පාඩු සහිත පාසල් වෙත ස්ථාන ගත කර දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඔවුන්ට පත් වීම් ලිපි නිකුත් කරයි.

**වෘත්තීය විෂයන් සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරුසේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළ පත්වීම් ලිපි නිකුත් කිරිම**

1. රේඛීය අධ්‍යාපන ලේකම් වසින් සුදුසුකම් ලත් උපාධිධාරීන්ගේ අයදුම්පත් කැඳවා තරඟ විභාගයට යොමු කර සුදුසුකම් ලබන්නන් දකුණු පළාතේ වෘත්තීය විෂයයන් උගන්වන පාසල් වෙත යොමු කරනු ලැබේ.

2. මෙලෙස යොමු කරන උපාධිධාරීන්ට පත්වීම් ලිපි නිකුත් කිරීම දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

## ගුරු සේවයේ සේවය ස්ථිර කිරීම.

ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කිරීමේ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විද්‍යුත්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. සේවය ස්ථිර කිරීමට බලය ලබාදීමේ වාර්තාව(බාගත කරගන්න)1
2. පත්වීම් ලිපියේ පෞද්ගලික ලිපි ගොනුවේ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පිටපතේ සහතික කල පිටපත
3. වැඩ භාර ගැනීම සටහන් කෙරෙන ලොග් සටහනේ / වැඩ භාරගත් ලිපියේ සහතික කල පිටපත
4. සෞඛ්‍ය 169 වෛද්‍ය පරීක්ෂකගේ වාර්තාවේ සහතික කල පිටපත
5. උපාධි / විද්‍යාපීඨ / ගුරු විද්‍යාල / අ.පො.ස.(සා.පෙළ) / අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සනාථ කිරීම් ලිපිවල සහතික කල පිටපත්
6. අංක 05 පරිශිෂ්ටය ප්‍රකාරව සමාලෝචන වාර්තා(බාගත කරගන්න)
7. පරිවාස කාලයට අදාල සවිස්තර නිවාඩු විස්තර සහතිකය ( B 100 වාර්තා මඟින්) කල පිටපත
8. පූර්ව සේවා පුහුණු සහතිකය (අදාල නම් පමණි)
9. වැටුප් රහිත නිවාඩු සඳහා අයකිරීම / හිලව් කිරීම අනුමත වාර්තාව
10. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත හා සනාථ කිරිමේ ලිපියේ සහතික කළ පිටපත
11. නමේ වෙනසට දිවුරුම් ප්‍රකාශයක් සහතික කල පිටපත (අදාල නම් පමණි)
12. අධ්‍යයන නිවාඩු අනුමත ලිපිය (අදාල නම් පමණි)
13. දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය(අදාල නම් පමණි)
14. විගණන විමසුම් හා විනය පරීක්ෂණ සම්බන්ධ ලිපිය
15. චර්යා සටහනෙහි සහතික කරන ලද පිටපත
16. පැවදිව සිටිනම් පැවැදි සහතිකය(අදාල නම් පමණි)
17. පැවදිව සිට උපැවිදි වී ඇත්නම් උපැවිදි සහතිකය(අදාල නම් පමණි)

සේවය ස්ථිර කිරිමට අදාල ලිපි ලැබීම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ස්ථිර කිරිමට ලිපිය නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

## ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම් ලබාදීම.

ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස් කිරීමේ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. උසස්වීම් අයදුම්පත්‍රය.(බාගත කර ගන්න)2.
2. විධිමත් ස්ථිර පත්වීම් ලිපියේ සහතික කළ පිටපත
3. මුල් පත්විම අනුව වැඩ භාර ගැනීමේ ලොග් සටහන් සහතික කළ පිටපත
4. පැරණි ගුරු සේවා ව්‍යවස්ථාව හා නව ගුරු සේවා ව්‍යවස්ථාව අනුව මේ දක්වා ලබා දී ඇති පත් කිරීම් හා ශ්‍රේණි උසස් වීම් ලිපි පිටපත්
5. පත්වීම ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපත්
6. විනය පරීක්ෂණ හා විගණන විමසුම පිළිබඳ වාර්තාව.
7. නව ගුරු ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියේ සහතික කළ පිටපත්
8. ගුරු පුහුණුව/උපාධි / පශ්චාත් උපාධි ප්‍රතිඵල සනාථ ලිපි.
9. වෙනත්(අදාළ වන්නේ නම් පමණි)

**ගුරු සේවයේ  උසස් කිරිමට අදාල ලිපි ලැබීම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | උසස්වීම් ලිපිය නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

## දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම.

දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය දකුණු පළාත්රජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. දකුණු පළාතට අන්තර්ග්‍රහණය කිරීමේ අයදුම් පත්‍රය( SP/PSC/ADM/FO/01 මුල් පිටපත) (බාගත කරගන්න)3.
2. අන්තර්ග්‍රහණය සඳහා ඉල්ලුම් කිරීම වසරකට වඩා ප්‍රමාද වී ඇත්නම් ඊට හේතු දක්වන ලිපිය
3. මුල් පත්වීම් ලිපියේ සහතික කල පිටපත
4. සේවය ස්ථිර කිරීමේ ලිපිය(සහතික පිටපත)
5. ස්ථාන මාරුව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලිපිය(සහතික පිටපත)
6. නිදහස් කල දිනය සනාථ වන පරිදි පෙර සේවා ස්ථානයෙන් ලබාගත් වාර්තා(සහතික පිටපත)
7. දකුණු පළාත් සභාවේ සේවයට වාර්තා කළ බවට සඳහන් ලිපියේ/ලොග් සටහන් පිටපතේ/වැඩ භාර ගත් බවට සඳහන් ලිපියේ ( සහතික කල පිටපත)

දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණයට **අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | අන්තර්ග්‍රහණයට අදාල ලිපි කොමිසමට නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

## නව ගුරු සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීම.

ශ්‍රී ලංකා ගුරු සේවයේ නව ගුරු සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීම ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. අයදුම්පත්‍රය (බාගත කර ගන්න)4.
2. මුල් පත්වීම් ලිපියේ සහතික කල පිටපත
3. මුල් පත්වීම අනුව වැඩභාර ගැනීමේ ලොග් සටහනේ සහතික කල පිටපත
4. ගුරු සේවයේ උසස් කිරීමේ ලිපිවල සහතික කල පිටපත්
5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2010 අනුව වැටුප් පරිවර්තන ලිපියේ සහතික කල පිටපත්

නව ගුරු සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණයට **අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | නව ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

## විශ්‍රාමික පත්වීම් පෙරදාතම කිරීම.

ශ්‍රී ලංකා ගුරු සේවයේ විධිමත් පත්වීම් පෙරදාතම කිරීම ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. පෙරදාතම අයදුම්පත්‍රය (බාගත කරගන්න)5.
2. අභ්‍යාසලාභී පත්වීම් ලිපියේ සහතික කල පිටපත
3. ස්ථිර පත්වීම් ලිපියේ සහතිකය
4. පත්වීම ස්ථිර කිරීමේ ලිපියේ සහතිකය
5. මුල් පත්වීම අනුව වැඩභාර ගැනීමේ ලොග් සටහනේ සහතිකය
6. අ.පො.ස.(සා.පෙ.) , අ.පො.ස.(උ.පෙ.) හා උපාධි ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපිවල සහතික කල පිටපත්

**විධිමත් පත්වීම් පෙරදාතම කිරීම අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | පෙරදාතම කිරිමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>ශ්‍රී ලංකා ගුරු සේවයෙන් මුදාහැරීම .</u>**

දකුණු පළාත් රාජ්‍ය සේවයට ශ්‍රී ලංකා ගුරු සේවයෙන් මුදාහැරීමේ ලිපිය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. මුදාහැරීම සඳහා ඉල්ලීම් ලිපිය
2. 10 පරිශිෂ්ඨය / 11 පරිශිෂ්ඨය (බාගත කරගන්න)6.
3. මුල් පත්වීම් ලිපියේ සහතික කල පිටපත
4. මුල් පත්වීම මත රාජකාරී භාර ගැනීමේ ලිපියේ සහතික කල පිටපත
5. එම තනතුරේ සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කල පිටපත
6. නව තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපියේ සහතික තල පිටපත
7. නව තනතුරට පත් කිරීමේ ලිපියේ සහතික කල පිටපත
8. එම තනතුරේ රාජකාරී භාර ගැනීමේ ලිපියේ සහතික කල පිටපත
9. විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් ඇති / නැති බවට සහතිකය (මුල් පිටපත)
10. රජයට අයත් බඩුභාහිරාදිය විධිමත් පරිදි භාරදුන් බවට සහතිකය (මුල් පිටපත)
11. රජයට අයවිය යුතු මුදල් අයකරගෙන ඇති බවට සහතිකය (මුල් පිටපත)
12. අවසන් මස වැටුප් විස්තරය (මුල් පිටපත)

**ශ්‍රී ලංකා ගුරු සේවයෙන් මුදාහැරීමට අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ගුරු සේවයෙන් මුදාහැරීමට අදාලව කොමිසමට ලිපි ඉදිරිපත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>අන්තර් කලාප ගුරු ස්ථාන මාරු ලබා දීම.</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරු ස්ථාන මාරු ලබා දීම පිළිබඳ (අන්තර් කලාප) ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. අයදුම් පත්‍රය. (බාගත කරගන්න)7.
2. පත්වීම් ලිපියේ සහතික පිටපත.
3. ස්ථිර කිරීමේ ලිපියේ සහතික පිටපත.
4. විනය පරීක්ෂණ හා විගණන විමසුම් නොමැති බවට ලිපියේ මුල් පිටපත

**ශ්‍රී ලංකා ගුරු සේවයෙන් ගුරු ස්ථාන මාරු(අන්තර් කලාප) ලබා දීමට අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ගුරු ස්ථාන මාරු(අන්තර් කලාප) ලබාදීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

<u>**අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු ලබා දීම**</u>

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරු ස්ථාන මාරු ලබා දීම පිළිබඳ (අන්තර් පළාත්) ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.මෙම

අවශ්‍ය ලිපි ලේඛන පිටපත් 03 බැගින්

1. අයදුම් පත්‍රය. (බාගත කරගන්න)8.
2. පත්වීම් ලිපියේ සහතික කල පිටපත.
3. විනය පරීක්ෂණ හා විගණන විමසුම් නොමැති බවට වාර්තාව
4. ස්ථිර කිරීමේ ලිපියේ සහතික කල පිටපත

**ශ්‍රී ලංකා ගුරු සේවයෙන් ගුරු ස්ථාන මාරු(අන්තර් පළාත්) ලබා දීමට අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ගුරු ස්ථාන මාරු(අන්තර් පළාත්) ලබාදීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>ගුරු සේවයෙන් ඉල්ලා අස්වීම.</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයෙන් ඉල්ලා අස්වීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. ඉල්ලීම් ලිපියේ මුල් පිටපත
2. මුල් පත්වීම් ලිපියේ මුල් පිටපත.
3. විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් ඇති / නැති බවට සහතිකය.
4. රජයට අයත් බඩුභාහිරාදිය විධිමත් පරිදි භාරදුන් බවට ඇති සහතිකය.
5. රජයට අයවිය යුතු මුදල් අයකරගෙන ඇති බවට සහතිකය.
6. වැටුප අයකර ගත් බවට සහතිකයේ මුල් පිටපත .
7. ආයතන සංග්‍රහයේ v පරිච්ඡේදයේ 4.3 , 4.3.1 හි සඳහන් කරුණු දැනුවත් බවට සහතිකය.
8. බැඳුම්කර හෝ ගිවිසුම් කිසිවක් නොමැති බවට සහතිකය.

**ශ්‍රී ලංකා ගුරු සේවයෙන් ඉල්ලා අස්වීම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ගුරු සේවයෙන් ඉල්ලා අස්වීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>අධ්‍යයන නිවාඩු අනුමත කිරීම.</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ අධ්‍යයන නිවාඩු අනුමත කිරීමේ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. වැටුප් සහිත අධ්‍යාපන නිවාඩු අයදුම් පත්‍රය.(බාගත කරන්න)9.
2. ඉල්ලීම් ලිපියේ මුල් පිටපත .
3. පාඨමාලාව සඳහා තෝරාගත් බවට නිකුත් කරන ලිපියේ සහතික කල පිටපත .
4. රාජකාරි ආවරණ ලිපියේ සහතික කල පිටපත .
5. විදුහල්පතිගේ නිර්දේශය සහිත ලිපිය .
6. විභාග කාල සටහනේ සහතික කල පිටපත .
7. සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කල පිටපත .
8. පැමිණීමේ සහතිකයේ සහතික කල පිටපත .

**ශ්‍රී ලංකා ගුරු සේවයේ අධ්‍යයන නිවාඩු අනුමත කිරිම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | අධ්‍යයන නිවාඩු අනුමත කිරීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>හදිසි අනතුරු නිවාඩු අනුමත කිරීම</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ හදිසි අනතුරු නිවාඩු අනුමත කිරීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. ගුරුභවතාගේ ඉල්ලීම් ලිපියේ මුල් පිටපත .
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නිර්දේශය .
3. දෙපාර්තමේන්තු පරීක්ෂණ වාර්තාව .
4. 5වන පොදු ආකෘති පත්‍රය .
5. අනතුර සම්බන්ධව දැනුම් දීමෙන් පසුව තබන ලද ලොග් සටහනේ සහතික කල පිටපත .
6. නැවත සේවයට වාර්ථා කිරීමෙන් පසු තබා ඇති ලොග් සටහනේ සහතික කල පිටපත .
7. ඇසින් දුටු සාක්ෂි 02 .
8. පොදු 142-I වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්ථාව .
9. රෝග නිශ්චය තුණ්ඩුව හා වෙනත් අදාළ වෛද්‍ය සහතිකය .

**ශ්‍රී ලංකා ගුරු සේවයේ හදිසි අනතුරු නිවාඩු අනුමත කිරිම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | හදිසි අනතුරු නිවාඩු අනුමත කිරිමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>විශේෂ රෝග නිවාඩු අනුමත කිරීම.</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ විශේෂ රෝග නිවාඩු අනුමත කිරීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. ඉල්ලීම් ලිපියේ මුල්පිටපත.
2. වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්ථාව සහතික කල පිටපත. (පොදු 142-I)
3. රෝග නිශ්චය තුණ්ඩුවේ සහතික කල පිටපත.
4. වෛද්‍ය වාර්තාවේ සහතික කල පිටපත.
5. නිවාඩු B-100 සහතික කල පිටපත
6. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශිත ලිපියේ සහතික කල පිටපත.
7. දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශිත ලිපියේ සහතික කල පිටපත.

**ශ්‍රී ලංකා ගුරු සේවයේ විශේෂ රෝග නිවාඩු අනුමත කිරිම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | විශේෂ රෝග නිවාඩු අනුමත කිරීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>විදේශ නිවාඩු අනුමත කිරිම.(කෙටි කාලීන/දීර්ඝ කාලීන)</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ විදේශ නිවාඩු අනුමත කිරීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. පොදු 126 ආකෘති පත්‍රයේ මුල් පිටපත
2. 16 වැනි පරිශිෂ්ටයේ මුල් ප්ටපත
3. ඉල්ලීම් ලිපියේ මුල් පිටපත
4. සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කල පිටපත
5. රාජකාරී ආවරණ ලිපියේ සහතික කල පිටපත
6. ජාතික හැඳුනුම්පතේ සහ විදේශ ගමන් බලපත්‍රය ලබාගැනීම සම්බන්ධ ලිපියේ පිටපත්
7. ගුරුභවතාගේ සහ රාජකාරී ආවරණය කරන ගුරුභවතාගේ කාලසටහන
8. 10 වැනි පරිශිෂ්ටයේ මුල් පිටපත
9. විදේශ නිවාඩු සඳහා පූර්ව අනුමැතිය ලබාදීමේ ලිපියේ සහතික කල පිටපත

**ශ්‍රී ලංකා ගුරු සේවයේ විදේශ නිවාඩු අනුමත කිරිම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | විදේශ නිවාඩු අනුමත කිරීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>විදේශ නිවාඩු සංශෝධනය කිරීම.</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ විදේශ නිවාඩු සංශෝධනය අනුමත කිරීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මගින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. දෙපාර්තමේන්තු නිලධාරින්ගේ / අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශය
2. සංශෝධනයට හේතු ඉදිරිපත් කිරීමට අදාළව ලියවිලිවල හා නිලධාරීන්යාගේ ඉල්ලීම් ලිපිය
3. ගුවන් ගමන් බලපත්‍රයේ සහතික කල පිටපත
4. වීසා බලපත්‍රයේ සහතික කල පිටපත
5. නැවත සේවයට වාර්ථා කිරීමේ ලිපිය හා රාජකාරී ආවරණය

**ශ්‍රී ලංකා ගුරු සේවයේ විදේශ නිවාඩු සංශෝධනය අනුමත කිරිම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | විදේශ නිවාඩු සංශෝධනය අනුමත කිරීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

<u>**ගුරු උපදේශක තනතුරට පත්කිරීම.**</u>

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරු උපදේශක තනතුරට පත්කිරීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විද්‍යුත්පති මගින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. අයදුම්පත්‍ර භාරගන්නා දිනට වයස අවුරුදු 54ට අඩුවිය යුතුයි.
2. කොට්ඨාස, කලාප, දිස්ත්‍රික්, පලාත් මට්ටමින් බඳවා ගැනීම සිදු කරන අතර අයදුම්කරුවන් තමන් ඉල්ලා සිටින කොට්ඨාසයේ, කලාපයේ, දිස්ත්‍රික්කයේ හෝ පලාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි.
3. ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනට ගුරුසේවයේ 1 හෝ 2-1 පන්තියට පත්ව තිබීම,සෞන්දර්ය අධ්‍යාපන,තොරතුරු තාක්ෂණය,ඉස්ලාම් ධර්මය , සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය,විශේෂ අධ්‍යාපනය,නාට්‍ය හා රංග කලාව,උපදේශන හා මාර්ගෝපදේශනය,ප්‍රායෝගික තාක්ෂණ කුසලතා ,දෙවන බස දෙමළ යන විෂයන් සඳහා ප්‍රමාණවත් අයදුම්පත් නොලැබුනු විට ගුරුසේවයේ 2-II ශ්‍රේණියේ වසර 10 ක් පලපුරුද්ද ඇති අයගෙන් බඳවා ගැනීමට අපේක්ෂිත හෙයින් එම ගුරු භවතුන්ටද අයදුම් කළ හැකිය.
4. පුහුණු උපාධිධාරියෙකු නම් වසර 05 ක්ද පුහුණුව හෝ ඩිප්ලෝමාධාරී ගුරුභවතකු නම් වසර 10 ක්ද ඉගැන්වීමේ පලපුරුද්ද ලබා සිටීම

<u>**විශේෂ සුදුසුකම්.**</u>

1. ඉස්ලාම් ධර්මය :- ඉහත මූලික සුදුසුකම්වලට අමතරව අල් අලිම් විභාගය සමත්ව තිබීම සහ මෞලවි සහතික ධාරීන් වීම.
2. දෙවන බස දෙමළ :- දෙමළ සඳහා ඉහත මූලික සුදුසුකම්වලට අමතරව දෙළ විෂය සහිතව සිංහල මාධ්‍යයෙන් අ.පො.ස (සා.පෙල) විෂය සමත්ව තිබිය යුතුය.

## <u>විශ්‍රාම පූර්ව නිවාඩු අනුමත කිරීම.</u>

ශ්‍රී ලංකා ගුරු සේවයේ විශ්‍රාම පූර්ව නිවාඩු අනුමත කිරීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විද්‍යුත්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. ගුරු භවතාගේ ඉල්ලීම.
2. 2016,2017,2018 හා 2019 වර්ෂවල බී 100 වාර්තා.
3. සනාථ කර ගන්නා ලද උප්පැන්න සහතිකය.

**ශ්‍රී ලංකා ගුරු සේවයේ විශ්‍රාම පූර්ව නිවාඩු අනුමත කිරිම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ගුරු සේවයේ විශ්‍රාම පූර්ව නිවාඩු අනුමත කිරීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**<u>ගුරු සේවයෙන් විශ්‍රාම ගැන්වීම.</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයෙන් විශ්‍රාම ගැන්වීම පිළිබඳ ලිපිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පති මඟින් අදාල ගුරුභවතා වෙත නිකුත් කෙරේ. ඒ සඳහා පහත ලිපි ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

අවශ්‍ය ලිපි ලේඛන

1. විශ්‍රාම ගැන්වීමේ නියෝග පත්‍රය (බාගත කරන්න)10.
2. විදුහල්පතිගේ නිර්දේශය සහිත ගුරුභවතාගේ ඉල්ලීම් ලිපිය
3. උප්පැන්න සහතිකයේ සහතික කල පිටපත
4. විධිමත් ස්ථිර පත්වීම් ලිපියේ සහතික කල පිටපත
5. සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කල පිටපත
6. විනය පරීක්ෂණ / විගණන විමසුම් සම්බන්ධ වාර්තා
7. ජාතික හැඳුනුම්පතේ සහතික කල පිටපත
8. PD 03 ආකෘති පත්‍රය
9. දිව්රුම් ප්‍රකාශය
10. නොඉල්ලුම් සහතිකය
11. වැටුප් රහිත/සහිත නිවාඩු සම්බන්ධ වාර්තාව

**ශ්‍රී ලංකා ගුරු සේවයෙන් විශ්‍රාම ගැන්වීම පිළිබඳ අදාල ලිපි නිකුත් කිරිම සම්බන්ධ යාවත්කාලීන වාර්තාව**

| අනු අංකය | නම | පාසල | කලාපය | ලැබුණු දිනය | ගුරු සේවයෙන් විශ්‍රාම ගැන්වීමට අදාල ලිපි නිකුත් කළ දිනය | අඩුපාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |